48

ස.සේ.කො.චක්‍රලේඛ අංක 02/2024

මගේ අංකය: ස.සේ.කො./01/iv වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,
කුරුණෑගල
2024.03. 07

වයඹ පළාතේ සියළුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරි/කළමනාකරු.

**MSSL වැටුප් පරිමාණයේ තනතුරු දරණ සේවකයින් සඳහා විශේෂ කාර්ය සාධනය යටතේ ශ්‍රේණි උසස්වීම් ලබා දීම.**

MSSL වැටුප් පරිමාණයේ තනතුරු දරණ ස්ථිර සමුපකාර සේවකයින් සඳහා විශේෂ කාර්ය සාධනය යටතේ ශ්‍රේණි උසස්වීම් ලබාදීමට පහත සඳහන් ක්‍රමවේදයන් අනුමත කිරීමට අංක 68/2024/03 හා 2024.02.05 දිනැති කොමිෂන් සභා නියෝගය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. ස.සේ.කො.03/2020 චක්‍රලේඛය යටතේ බඳවා ගැනීමේ සුදුසුකම ලෙස අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම හෝ ඊට ඉහළ බඳවා ගැනීමේ සුදුසුකමක් නියම කර ඇති (MSSL(T) හා MSSL වැටුප් පරිමාණයේ (හෙද සහයක/සහායිකා,රියදුරු, තැන්පත් වර්ධන සහයක,යන්ත්‍ර ක්‍රියාකරු,කාර්යාල කාර්ය සහයක සහ උපස්ථායක / උපස්ථායිකා) තනතුරුවල සේවය කරන සේවකයන් සඳහා :

    I. සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනමන මාස තුනකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලාවක් සාර්ථකව නිම කර සහතිකයක් ලබා තිබීම.
    සහ
    වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02. ස.සේ.කො.03/2020 චක්‍රලේඛය යටතේ බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම ලෙස අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටීම හෝ ඊට අඩු බඳවා ගැනීමේ සුදුසුකමක් නියම කර ඇති MSSL(T) හා MSSL වැටුප් පරිමාණයේ (පොත් බැඳුම්කරු සුළු සේවක පාලක,බස් කොන්දොස්තර, බේකරිකරු/බක්කරේ, බෙහෙත් ගැල්වුම් ශිල්පි (මල්ශාලා),රිය සහායක, වෙළඳ සහකාර, මුරකරු/ ආරක්ෂක නියාමක, සර්විස්කරු/සේවාකරු, කම්කරු සහ සනීපාරක්ෂක කම්කරු) තනතුරුවල සේවය කරන සේවකයින් සඳහා :

    I. සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ) විසින් පිළිගත් ආයතනයකින් රැකියා ක්ෂේත්‍රයට අදාළව පැය 40 ක් / දින පහකට නොඅඩු පුහුණු පාඨමාලාවක්/පුහුණු වැඩ සටහනක් සාර්ථකව නිමකර තිබීම.
    සහ
    වසර 05 සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03.මමම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ).

එච්.එම්.පී.කේ. හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
වයඹ පළාත.

<u>පිටපත්:</u>

01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත - කා.දැ.පි.

02.ලේකම්,සමුපකාර සංවර්ධන වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති,ක්‍රීඩා හා යෞවන කටයුතු සංස්කෘතික,කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.පි.

03.සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් - වයඹ පළාත - දැ.පි. හා අ.ක.ස.

04.සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.පි. හා අ.ක.ස.

05.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල/හලාවත/කුලියාපිටිය - දැ.පි. හා අ.ක.ස.